Prepared by- පී.ඊ.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School

අනුශාංගික කලා හා අනුශාංගික ශිල්පීන් හඳුනාගනිමු.

අනුශාංගික කලා යනු මොනවාද ?

සතර අභිනයට අයත් සිව්වන අභිනය වන්නේ ආහාර්යය අභිනයයි.එම අභිනය නළුවාගේ රංගනය පහසු කරලීමට නළුවාට පරිබාහිරින් එකතුවන සෙසු කලා අංග අනුශාංගික කලා ලෙස හඳුන්වයි.එසේම මෙම අංග නාට්‍යක් නිෂ්පාදන ක්‍රියාවලියේදී එකතුවන සෙසු කලා අංග වන අතර ප්‍රේක්ෂයාට පහසුවෙන් නාට්‍ය හා බැඳීමට,නාට්‍යය වඩාත් සාර්ථක කර ගැනීමට අනුශාංගික අංග ඉවහල්වේ.

ඒ අනුව අනුශාංගික අංග ලෙස,

1.රංග වස්ත්‍රාභරණ

2.අංග රචනය

3.වේදිකා පසුතල නිර්මාණ

4.රංග භාණ්ඩ

5.රංගාලෝකය

6.නාට්‍ය සංගීතය

7.රංග වින්‍යාසය   වැනි අංග හැඳින්විය හැක.

නාට්‍ය නිෂ්පාදකවරයාගේ උපදෙස් පරිදි මෙම අනුශාංගික කලා අංග නාට්‍ය සඳහා සැළසුම් කිරීම හෝ නිර්මාණය කරීම සිදුකරන්නේ ඒ ඒ කලාවන්ට අදාළ ප්‍රවීන කලා කරුවන් විසින් වන අතර එම සැළසුම් සැකසීම,ක්‍රියාවට නැංවීම , නිෂ්පාදනය කරීම,සහය වීම ,වාදනය කිරීම වැනි දේ සිදුකරනු ලබන්නේ ඒ ඒ කලාවන්ට අදාල ශිල්පීන් විසින්ය.ඒ අනුව අනුශාංගික අංග කලා කරුවන් හා අනුශාංගික නිර්මාණ ශිල්පීන් යනු දෙපිරිසකි. (ඇතැම් අවස්ථා වලදී අනුශාංගික අංග සැලසුම් නිර්මාණකරු විසින්ම එම සැලසුම් නිෂපාදන කටයුතු කිරීමද සිදු කරයි.)

අනුශාංගික අංග නිර්මාණ කිරීමට දායක වන නිර්මාණකරුවන් හා ශිල්පීන්

| | අනුශාංගික අංගය | නිර්මාණකරුවා /කලාකරුවා | දායක වන ශිල්පීන් |
|---|---|---|---|
| 1 | රංග වස්ත්‍රාභරණ | වස්ත්‍රභරණ හා සැළසුම් හා නිර්මණකරුවා | අභරණ,රංග වස්ත්‍ර නිෂ්පාදන ශිල්පීන් |
| 2 | අංග රචනය | අංග රචන නිර්මාණකරුවා | අංග රචන සහය ශිල්පි |
| 3 | වේදිකා පසුතල | වේදිකා පසුතල සැළසුම් හා නිර්මාණ කරුවා | වේදිකා පසුතල නිෂ්පාදන ශිල්පින් (වඩු කාර්මික) |
| 4 | රංග භාණ්ඩ | රංග භාණ්ඩ සැලසුම් හා නිර්මාණකරුවා | සහය ශිල්පීන් |
| 5 | රංගාලෝකය | රංගාලෝක සැළසුම් කරුවා | කාර්මික ශිල්පීන් |
| 6 | නාට්‍ය සංගීතය | නාට්‍ය සංගීත අධ්‍යක්ෂක | ගායන/වාදන ශිල්පීන් |
| 7 | රංගවින්‍යාසය | නර්තන අධ්‍යක්ෂක | නර්තන ශිල්පීන්/සෙසු නළු නිළියන් |

වේදිකා නාට්‍ය කලාවේ අනුශාංගික කලා නිර්මාණ ශිල්පීන්

| | අනුශාංගික අංගය | සම්මානනීය ප්‍රවීන නිර්මාණකරුවා /කලාකරුවාගේ නම |
|---|---|---|
| 1 | රංග වස්ත්‍රාභරණ | ධනපාල බෝගොඩ,කාන්ති බෝගොඩ,ප්‍රසන්නජිත් අබේසූරිය,ලයනල් බෙන්තරගේ |
| 2 | අංග රචනය | වසන්ත විට්ටච්චි,ජයන්තා රණවක,ජගත් පත්මසිරි, |
| 3 | වේදිකා පසුතල | ප්‍රදීප් චන්ද්‍රසිරි,ලයනල් බෙන්තරගේ |
| 4 | රංග භාණ්ඩ | ලයනල් බෙන්තරගේ, |
| 5 | රංගාලෝකය | මහින්ද ඩයස්,උපාලි වීරසිංහ,රංග සමරකෝන් |
| 6 | නාට්‍ය සංගීතය | ජයන්ත අරවින්ද,ඩබ්.ඩී.අමරදේව,නවරත්න ගමගේ,ප්‍රේමසිරි කේමදාස,ශාන්ත පීරිස් |
| 7 | රංගවින්‍යාසය | මිරන්ඩා හේමලතා,ප්‍රසන්නජිත් අබේසූරිය,රවිබන්දු විද්‍යාපති,ජෙරොම් ද සිල්වා |

මීට අමතරව අනුශාංගික ශිල්පීන් ලෙස නාට්‍ය පෙළ මතක්කරන්නන්,සහය වේදිකා පරිපාලකවරු මේ යටතට අයත්වේ.

පැවරුම

1.අනුශාංගික කලාව හඳුන්වන්න.

2.වේදිකා නාට්‍යයක් සඳහා දායක කරගන්නා අනුශාංගික අංග මොනවාද ?

3.වේදිකා නාට්‍යක් සඳහා දායක වන් වෙනත් කලා නිර්මාණකරුවන් නම් කරන්න.

4.වේදිකා නාට්‍යයක් සඳහා අනුශාංගික අංග දායක කරගැනීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

5.අනුශාංගික කලාකරුවා ( නිර්මාණකරුවා ) හා අනුශාංගික ශිල්පියා අතර වෙනස පැහැදිලි කරන්න.